**ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 3,423.04 ක් වූ මූලධන වත්කම් පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම සහ අත්පත් කරගැනීමේ වියදම, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) රු.මිලියන 420.62 කින් අඩුවෙන් දක්වා තිබුණි. | තාක්ෂණික දෝෂ නිසා 2022 වර්ෂ අවසානයට ගිණුම් ගත කිරීමට නොහැකි වූ ශේෂය 2023 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | මූලධන වියදම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| ii. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වර්ෂය තුළ මිලදී ගත් වෙනත් යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ ප්‍රාග්ධන අයිතම 18 ක නොනිමි වැඩ ශේෂ රු.බිලියන 1.81 ක් වැඩියෙන් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ- 6) දක්වා තිබුණි. | විගණනයට ලබාදුන් තොරතුරු පරීක්ෂා කරමින් පවතින අතර, ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | මූලධන වියදම් සහ නොනිමි වැඩ නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| iii. පෙර වර්ෂවල සිට අවිච්ඡින්නව පැවති ඉදිකිරීම්/නවීකරණවලින් කොටසක් ඇතුලුව සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කරන ලද වටිනාකම රු.මිලියන 467.3 ක් වූ අතර, වර්ෂය අවසානයේ මෙම වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කර නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | අදාළ වටිනාකම් ප්‍රාග්ධනිත කළ යුතු වීම. |
| iv. සමාලෝචිත වර්ෂය තුළ යුද්ධ හමුදාවට අයත් වාහන, ධාවන පැදි, ට්‍රැක්ටර් ටේලර් 334ක්, කාර්යාල ගෘහ භාණ්ඩ හා විදුලි උපකරණ 91ක් සහ බර යන්ත්‍ර උපකරණ 26ක් අපහරණය කර රු.මිලියන 289.91 කට අලෙවි කර තිබුණු අතර, මෙම වත්කම්වල පිරිවැය ජංගම නොවන වත්කම්වලින් ඉවත් කර නොතිබුණි. | දේපල ලේඛනයෙන් ඉවත්කර ඒ පිළිබඳ විස්තර හා ජර්නල් සටහන් මූල්‍ය ප්‍රකාශන වෙත ඇතුළත් කිරීම සඳහා කඩිනමින් ලබා දීමට කටයුතු කරනු ලබන බව. | අදාළ වත්කම්වල පිරිවැය ගිණුම් වලින් ඉවත් කළ යුතු වීම. |

#### (ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) යුද්ධ හමුදාවට අයිති බිම් කැබලි 15 ක් සහ යුද්ධ හමුදාව පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 330 කට අයත් අක්කර 10,240 ක ඉඩම් සහ රු.බිලියන 80.67 ක ගොඩනැගිලි වටිනාකම හෙළිදරව් කර නොමැති අතර, මේ නිසා මෙම වත්කම්වල වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි. | අදාළ වත්කම් තක්සේරු කරවා ගැනීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව. | යුද්ධ හමුදාවට අයිති ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරුකර ගිණුම්ගත කළ යුතු අතර, දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින මෙම වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) ඇතුළත් වත්කම් වර්ග 28 ක පසුගිය වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු.මිලියන 182.82 ක් අඩුවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි. | පසුගිය වර්ෂයේ අවසාන ශේෂයන්හි ඇතුළත් නොවූ වටිනාකම් ගිණුම් ගත කිරීමෙන් පසුව මෙම වෙනස හටගෙන ඇති බව. | අදාළ සංඛ්‍යා නොසැසඳීමට හේතුව මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |
| iii. | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) සමාලෝචිත වර්ෂය අවසානයට නොනිමි වැඩ ශේෂය රු.බිලියන 5.79 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ එය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව. | නිවැරදි වටිනාකම් හඳුනාගෙන කඩිනමින් ගිණුම් ගත කළ යුතු වීම. |
| iv. | රු.මිලියන 3 ක් වටිනා අශ්වයින් දෙදෙනෙකු පාකිස්ථානු රජයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණද, මොවුන් යුද්ධ හමුදාව විසින් ඉන්වෙන්ට්‍රි ගත කර ගිණුම්වලට ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මෙම අශ්වයින් දෙදෙනා මියාම නිසා වූ හානිය, අලාභ හානි ලෙස වාර්තා කර හෝ ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී යුද්ධ හමුදාවට අයත් වටිනාකම හෙළිදරව් නොවුණු සුනඛයකු ද මියගොස් තිබුණු අතර, එම තත්ත්වයද අලාභ හානි ලෙස වාර්තා කර හෝ ගිණුම්වලට ගැලපීම් කර හෝ නොතිබුණි. | කාර්යාල ප්‍රමාද දෝෂයකින් ලේඛනය වෙත ඇතුළත් කර නොමැති බැවින් ගිණුම් ගත වී නොමැති අතර, අදාළ අශ්වයින් හා සුනඛයා ඉන්වෙන්ට්‍රි ගත කර ගිණුම්වලට ඇතුළත් කර අදාළ මියයෑම් සම්බන්ධයෙන්, නැතිවීම් හා අලාභ හානි පිළිවෙත අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කරනු ලබන බව. | වත්කම් පරිත්‍යාග ලෙස ලැබීමේදී සහ ඒවාට හානි සිදුවීමේදී නිවැරදිව ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනය මඟින් දැක්විය යුතු වීම. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යුද්ධ හමුදාවට අයිති හා යුද්ධ හමුදාව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 15 ක් සහ රු.බිලියන 35.09 ක් වටිනා ගොඩනැගිලි 2,163 ක් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව හෝ මු.රෙ 502(2) එහි II වැනි පරිශිෂ්ඨය පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක හෝ 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගැස් වැඩසටහනෙහි වාර්තා කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කිරීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි හා රජයේ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) වත්කම් කාණ්ඩ 05 කට අදාළව වත්කම් වර්ග 29 ක ආරම්භක ශේෂයට කරන ලද එකතු කිරීම් ලෙස රු.බිලියන 17.04 ක දක්වා තිබුණු අතර, මෙම වටිනාකම් විගණනයට සනාථ කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනෙන් පසු එදිනට පැවතිය යුතු ආරම්භක ශේෂයන්හි ඇතුළත් නොවූ වටිනාකම් හඳුනාගැනීමෙන් පසුව ගිණුම්ගත කර ඇති බව. | අදාළ වෙනස්කම් ජර්නල් සටහන් මඟින් නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 222-01-03-005-2509 දරන ආරක්ෂාව හා ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා වන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා-ඉන්දියා) සඳහා සළසා ගෙන තිබුණු එකතුව රු.මිලියන 205 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. | රට තුළ හටගත් ආර්ථික අර්බුදය හමුවේ විදේශ ණය මත සිදු කිරීමට නියමිතව තිබූ ප්‍රසම්පාදනයන් අත්හිටුවීම මත මෙම ඉතිරි වීම් සිදු වී ඇති බව. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කලයුතු වීම සහ රාජ්‍ය ණයවල පිරිවැය සළකා බැලිය යුතු වීම. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයන් 22 ක් සඳහා එකතුව රු.බිලියන 40.87 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන්, එකතුව රු.බිලියන 11.22 ක ප්‍රතිපාදනද, මූලධන වැය විෂයන් 8 ක් සඳහා එකතුව රු.බිලියන 1.76 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන්, එකතුව රු.මිලියන 419.94 ක ප්‍රතිපාදනද උපයෝජනය කර නොතිබුණි. එම ඉතිරි කිරීම් ප්‍රමාණය සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 88 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | රට තුළ පැවති ආර්ථික අර්බුදය හමුවේ බිල්පත් නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් නොලැබීම, භාණ්ඩ හිඟ වීම හා විදේශ විනිමය හිඟතාවය මත මෙම ඉතිරිවීම් සිදු වී ඇති බව. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයන් පහකට සහ මූලධන වැය විෂයන් තුනකට සළසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ. 66 යටතේ පිළිවෙලින් රු.බිලියන 4.61 ක් සහ රු.මිලියන 145.5 ක් වෙනත් වැය විෂයන්වලින් මාරුකරගෙන තිබුණු අතර, පුනරාවර්තන වැය විෂයන් දෙකකට රු.බිලියන 9.64 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ද සළසාගෙන තිබුණි. | ආර්ථික අර්බුදය හමුවේ ඇතැම් වැය විෂයන්ට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත්, තවත් වැය විෂයන්වල ප්‍රතිපාදන ඉතිරිවීම සහ ද්‍රවශීල මුදල් නොලැබීමෙන් මෙම තත්ත්වය හටගෙන ඇති බව. | - එම - |

| | | |
|---|---|---|
| **(ඈ)** වැය විෂයන් විසි හතක් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූයෙන් එය ඉක්මවා වර්ෂය අවසානයට රු.බිලියන 9.81 ක බැරකම් සඳහා බැඳීමට සිදු වී තිබුණි. | - එම - | - එම - |
| **(ඉ)** අංක 222-01-02-1203 වැය විෂයට (ආහාර හා නිල ඇඳුම්) ලබා දුන් එකතුව රු.බිලියන 9 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් වර්ෂය අවසානයට සියයට 99 ක් හෙවත් රු.බිලියන 8.91 ක්ද, ප්‍රාග්ධන වැය විෂයන් දෙකක් සඳහා වෙනත් වැය විෂයන්ගෙන් මු.රෙ 66 යටතේ මාරුකරගෙන තිබුණු රු.මිලියන 37.83 ක ප්‍රතිපාදනවලින් සියයට 32 ක්ද වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි. | ආර්ථික අර්බුදය හමුවේ ප්‍රමාණවත් මුදල් නොලැබීම මත මෙම තත්ත්වය හටගෙන ඇති බව. | - එම - |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** මුදල් රෙගුලාසි 94(1) හා 214 ප්‍රකාරව පනවා ඇති නියමයන් අනුව කටයුතු නොකිරීම නිසා මසක කාලයක් තුළ පියවීමට නොහැකි වූ බැරකම් වටිනාකම රු.බිලියන 12 ක් විය. | මේ වන විට එම බිල්පත් නිරවුල් කරමින් පවතින බව. | බැරකම් කඩිනමින් බේරුම් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ආ)** මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් ආයතන 67 ක නියැදියකින් ශේෂ සනාථයන් කැඳවූ අතර, ආයතන 30 කට ගෙවිය යුතු එකතුව රු.බිලියන 5.36 ක බැරකම් එම ආයතන විසින් සනාථ කර නොතිබුණි. තවද සනාථන ලබා දුන් ආයතන 3 ක් ශේෂයන් හා එකඟ වූ අතර, ආයතන 16 ක් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ බැරකම් ප්‍රමාණයට වඩා එකතුව රු.බිලියන 2.22 ක් අඩුවෙනුත්, ආයතන 18 ක්, එකතුව රු.බිලියන 1.57 ක් වැඩියෙනුත් වාර්තා කර තිබුණි. | එක් එක් වැය විෂයයන් පාලනය කරනු ලබන යුද්ධ හමුදා අධ්‍යක්ෂ මණ්ඩල වෙතින් ඉදිරිපත් කරනු ලබන බිල්පත් පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව. | ශේෂ අතර වෙනස්කම්වලට හේතු නිශ්චිතව සොයා ගෙන නිවැරදි කිරීම් කඩිනමින් කළ යුතු වීම. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වැය විෂයන් 07කට අදාළව විවිධ ව්‍යාපෘති/වැඩසටහන් 15 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.මිලියන 1,152.83 ක මූලධන ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 634.16 ක ප්‍රතිපාදන | රට තුළ පැවති තත්ත්වය මත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම සහ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම මත ප්‍රතිපාදන | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන ප්‍රශස්ත |

| | | | |
|---|---|---|---|
| | ඉතිරිවීම් තිබුණු අතර, එම ඉතිරි කිරීම් ප්‍රතිශතය සියයට 8 සිට සියයට 90 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ එකතුව රු.මිලියන 58.63 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු ලග්ගල හා ගජසිංහපුර ප්‍රවේශ මාර්ග සහ මීමුරේ ප්‍රාථමික විද්‍යාල ගොඩනැගිල්ලක වැඩ නිමකිරීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 5, 15 සහ 20 තරම් අවම මට්ටමක පැවතුණි. තවද, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ ක්‍රීඩාංගන සංවර්ධනය කිරීමට යන්ත්‍ර නඩත්තු වියදම් දැරීම සඳහා රු.මිලියන 10.64 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර වර්ෂ අවසානයට ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරි වී තිබුණි. | ප්‍රමාණවත් නොවීම නිසා මෙම තත්ත්වය හටගෙන ඇති බව. | මට්ටමෙන් උපයෝජනය කළ යුතු වීම. |
| **(ආ)** | **ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ එල්ලංගා වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ ප්‍රගතිය**<br><br>2018 වර්ෂයේ අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අනුරාධපුර දිස්ත්‍රිකයේ වැව් 11 ක් රු.මිලියන 113 ක වියදමින් වැව්බැම්, නාන තොටුපළ, රළපනාව, ප්‍රවේශ මාර්ග, රොන්මඩ ඉවත් කිරීම, වාන් ඇළ ඉදිකිරීම, ප්‍රධාන කෘෂි මාර්ග නවීකරණය, සොරොව් ඉදිකිරීම හා නාම පුවරු සකස් කිරීම වැනි ප්‍රතිසංස්කරණයන් සිදුකිරීම සඳහා ඇතැම් වැඩ කොටස් යුද්ධ හමුදාවට පවරා, රු.මිලියන 100 ක ප්‍රතිපාදනද වෙන්කර දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| i. | දූනුමඩලාව, නැඹඩගස්දිගිලිය, ගලහිටියාව, හැළඹ යන වැව් හතරෙහි නවීකරණ කටයුතුවල නිමකිරීමේ ප්‍රතිශතය සියයට 70 සිට 90 දක්වා වූ අතර, මෙම වැව්වල ඇතැම් අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු ඉටුකර නොතිබුණු නිසා සහ විශාල කළු ගල්, ඇතුලු ඉදිකිරීමේ ද්‍රව්‍ය ඇතැම් වැව් පරිශ්‍රවල ගොඩගසා තිබීමෙන් වැව් පරිහරණය කරන ග්‍රාමීය ජනතාව අපහසුතාවයට ලක්ව තිබුණි. | අදාළ වැව් වල ප්‍රතිසංස්කරණ කාර්යයන් ප්‍රතිපාදන අනුමත නොවීම හේතුවෙන් අත්හිටුවීමට සිදුවූ බව සහ බොහෝ කාර්යයන් අවසන් කර ඇති බව. | ඇස්තමේන්තු කරන ලද ප්‍රතිසංස්කරණයන් සිදු කළ යුතු වීම හා ජනතාවට සිදුවන දුෂ්කරතා පිළිබඳ අවධානය යොමු කළ යුතු වීම. |
| ii. | යුද්ධ හමුදාවේ ඉල්ලීම මත ජනාධිපති කාර්යාලයේ අනුමැතිය යටතේ රු.මිලියන 28.01 ක් වැයකර ට්‍රැක්ටර් 10 ක්, යතුරුපැදි 05 ක්, ඩෙක්ස්ටොප් පරිගණක 05 ක්, ඡායා පිටපත් යන්ත්‍රයක්, LED රූපවාහිනි යන්ත්‍ර 05 ක්, තණකොළ කපන යන්ත්‍ර 03 ක් හා Chainsaw යන්ත්‍ර 03 ක් මිලට ගෙන තිබුණු අතර, මෙම කාර්යාල හා යන්ත්‍ර උපකරණ අදාළ ව්‍යාපෘතියට සෘජුවම දායක කර ගත්තේද යන්න අනාවරණය කරගත නොහැකි විය. තවද, වැව්ඉදිකිරීමේ ඇස්තමේන්තුවල සඳහන් නොවුණු | අදාළ වත්කම් ජනාධිපති ලේකම් කාර්යාලයේ අනුමැතිය පරිදි මිලදීගෙන ව්‍යාපෘතියේ කටයුතු සඳහා යෙදවීමට කටයුතුකර ඇති අතර, සමාරම්භක උත්සවය යුද්ධ හමුදාව ඉටුකළ යුතු බවට ජනාධිපති කාර්යාලයෙන් යුද්ධ හමුදාවට දැනුම්දී | අදාළ ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන පසුබිමක ව්‍යාපෘති ඇස්තමේන්තුවේ සඳහන් වියදම් පමණක් දරා ව්‍යාපෘතිය සාර්ථක |

| | | | |
|---|---|---|---|
| | සමාරම්භක උත්සව සඳහා රු.මිලියන 1.84 ක් වැයකර තිබුණු අතර, අදාළ වැව් ප්‍රතිසංස්කරණයන් සඳහා අවශ්‍ය බව දක්වමින් යුද්ධ හමුදාවේ බර වාහන හා බර යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාවන් සඳහා රු.මිලියන 3.8 ක්ද වැයකර තිබුණි. | තිබුණු බව සහ මෙම ව්‍යාපෘතිය සඳහා යොදවා ඇති යන්ත්‍ර/වාහන අලුත්වැඩියා කර ගැනීමටද සිදුවූ බව. | කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| iii. | මෙම ව්‍යාපෘතියේ මූලික ඇස්තමේන්තුවට අනුව යුද්ධ හමුදාව විසින් කිලෝ ග්‍රෑම් 50 සිමෙන්ති මිටි 2802 ක් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබාගෙන එයින් රු.මිලියන 1.6 ක් වටිනා සිමෙන්ති මිටි 1482 ක් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා සෘජුව අදාළ නොවන යුද්ධ හමුදා කඳවුරුවල විවිධ ඉදිකිරීම් සඳහා භාවිතා කර තිබුණි. | සිමෙන්ති මිටි 393 ක් ව්‍යාපෘතියේ සහයක ඉදිකිරීම් සඳහාද, මිටි 218 ක් ව්‍යාපෘති ප්‍රමාදය නිසා නුසුදුසු තත්ත්වට පත්වී තිබුණු බව සහ ඉතිරි සියල්ල ව්‍යාපෘතියට යොදවා ඇති බව. | අදාළ ව්‍යාපෘතිය සඳහා ලබා දුන් සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කර ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| iv. | රු.මිලියන 1.54 ක් වැයකර කළුගල් කියුබ් මීටර් 400 ක් නඹඩගස්දිගිලිය වැවේ රළපනාව ඉදිකිරීම සඳහා යුද්ධ හමුදාවෙන් ප්‍රසම්පාදනය කරගෙන තිබුණු අතර, මෙයින් කියුබ් මීටර් 50 කට වැඩි ප්‍රමාණයක් එම වැව් පරිශ්‍රයේ ගොඩගසා තිබුණි. | 2019 වර්ෂයෙන් පසුව ප්‍රතිපාදන ලබානොදීම හේතුවෙන් ඉදිකිරීමේ කාර්යයන් අවසන් කිරීමට නොහැකිවී ඇති බව. | අදාළ ව්‍යාපෘතිය සඳහා ගෙන එන ලද කළුගල් ව්‍යාපෘතිය සඳහා යොදවා ගත යුතු වීම. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය ඉක්ම වූ වර්ෂ 31 දක්වා කාල පරාසයක් තුළ සේවය හැරගොස් ඇති හමුදා නිලධාරීන් 3,314 දෙනෙකුගේ හා සිවිල් නිලධාරීන් 444 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 43.23 ක ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.3 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකරගෙන නොතිබුණි. මෙම ණය ශේෂ වලින් රු.මිලියන 13.95 ක් වර්ෂ 10 ඉක්මවා තිබුණි. | මෙම ණය ශේෂයන් අයකර ගැනීමට විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇති බව. | මෙම ණය ශේෂ කඩිනමින් අයකරගත යුතු වීම. |
| (ආ) | විශ්‍රාම ගිය හමුදා නිලධාරීන් 182 දෙනෙකුගෙන් සහ සිවිල් නිලධාරීන් 68 දෙනෙකුගෙන් වර්ෂය ඉක්ම වූ වර්ෂ 17 දක්වා කාල පරාසයක් තුලදී අය නොවූ ණය ශේෂවල එකතුව රු.මිලියන 14.78 ක් වූ අතර, මෙම ණය ශේෂවලින් රු.මිලියන 3.04 ක් වර්ෂ 5 ඉක්ම වූ ණය ශේෂ වුවත්, ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මෙම ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. | - එම. - | - එම . - |

### 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 (4)** | 2021 වර්ෂයේ යුද්ධ හමුදාවේ වාහන 05 කට රිය අනතුරු වලින් සිදු වූ රු.මිලියන 5.86 ක අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | වාහනවල අලුත්වැඩියා වටිනාකම මූලික පරීක්‍ෂණ මණ්ඩලය ලබාදෙන තෙක් මෙම වාර්තා ලබාදිය නොහැකි බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්ම අනුව වැය විෂයයන් 06 ක් සඳහා සියයට සියයක ඉලක්කගත භෞතික ප්‍රගතියක් දක්වා තිබුණ ද, භෞතික කාර්ය සාධනය සියයට 50 ත් 74 ත් අතර සහ සියයට 75 ත් 89 ත් අතර, වැඩසටහන් 03 බැගින් පැවතුණි. | ද්‍රවශීල මුදල් නොලැබීම මත එම ව්‍යාපෘති සඳහා නිරවුල් නොවුණු බැරකම් වටිනාකමත් සමඟ එහි කාර්යසාධනය සියයට 86 සිට සියයට 100 දක්වා ප්‍රමාණයක් බව. | ඉලක්කගත සැලසුම් කරා ලඟා වීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා රු.බිලියන 47.45 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනය කර ගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයන් දක්වා නොතිබුණි. | වසර තුනක් සඳහා වන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම සඳහා, ඉදිරියේදී මිලදී ගනු ලබන ඒකක ප්‍රමාණයන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සැලසුම් සකස් කළ යුතු වීම. |

**(ආ)** සමාලෝචිත වර්ෂයේ සීමිත/පාලිත ජාතික තරඟකාරී ක්‍රමය, ජාතික තරඟකාරී ලංසු ක්‍රමය සහ මිල සැඳැහුම් ක්‍රමය අනුගමනය කරමින් සිදුකර තිබුණු රු.මිලියන 886.76 ක ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් අනාවරණය වූ පොදු කරුණු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| **i.** | 3.3 ප්‍රසම්පාදනය මාර්ගෝපදේශයේ සඳහන් නිර්නායකයන් පිළිබඳ නොසළකා රු.මිලියන 692.82 ක ප්‍රසම්පාදනයන් සඳහා සීමිත/පාලිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යොදාගෙන තිබුණි. | හමුදාවන්ට ආවේණික සංකීර්ණ තත්වයන් යටතේ ප්‍රසම්පාදනයන් බාධාවකින් තොරව සිදු කර යාම සඳහා මෙම ප්‍රසම්පාදන ක්‍රමය භාවිතා කොට ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව වඩාත්ම සුදුසු ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගත යුතු වීම. |
| **ii.** | ඇතැම් මිලදී ගැනීම්වලදී එක් එක් සැපයුම් කාණ්ඩ සඳහා සැපයුම්කරුවන් විශාල ප්‍රමාණයක් ලියාපදිංචි වී සිටියද ඉතා සීමිත සැපයුම්කරුවන් ප්‍රමාණයකගෙන් මිල ගණන් විමසා තිබුණු අතර, මෙම මිල සැපයුම්කරුවන් තෝරාගත් පදනමද විගණනයට අනාවරණය නොකෙරුණි. | ගණන්දීමේ නිලධාරි අදහස් දක්වා නොතිබුණි. | ලංසුකරුවන් තෝරාගත් පදනම විගණනයට අනාවරණය කළ යුතු වීම. |
| **iii.** | තෝරාගත් සැපයුම්කරුවන් සතුව තොග පවතීද යන්න නිශ්චිතව සොයා බැලීමකින් තොරව මිල ගණන් ඉල්ලුම් කිරීම නිසා ආයතන 200 කට අධික ප්‍රමාණයකගෙන් මිල ගණන් ඉල්ලා තිබුණද, ලැබී තිබුණු මිල ගණන් සංඛ්‍යාව 10 කට අඩු ප්‍රමාණයක පැවතුණු අතර, මිලගණන් ඉල්ලීම් ලේඛන ලංසුකරුවන්ට යැවූ බවට තැපැල් කුවිතාන්සි හෝ විද්‍යුත් පණිවිඩ සනාථන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | තොග පවතීද යන්න පරීක්ෂා කිරීමක් සිදුකරනු නොලබන අතර, මිල කැඳවීමට ප්‍රථම අදාළ ආයතන සමඟ කිසිදු සබඳතාවයක් නොපවත්වන බව. | ලංසු ඉල්ලුම් කිරීමේ විකල්ප ක්‍රම සොයා බැලීමටත්, අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

**(ඇ)** එක් එක් ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| **i.** | රු.මිලියන 132.45 ක වියදමින් යුද්ධ හමුදාවේ නිලධාරින්/ සෙසුනිලයන් පළඳින යුධ හමුදා ලාංඡනය ඇතුළත් වන පරිදි සැකසූ නාමපුවරු 165,100 ක් මිලදී ගැනීමේදී වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සියයට 28 කින් ඉක්මවා තිබුණු අතර, පිරිවිතර ලේඛනය අඩුපාඩු සහිතව පිළියෙල කර තිබීම නිසා ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීමෙන් භාණ්ඩ ලැබීමට වර්ෂ දෙකකට අධික කාලයක් ගතවීමෙන් යුද්ධ හමුදාධිපතිගේ නියෝගය පරිදි 73 වන නිදහස් දින පෙළපාලියට මෙම නාමපුවරු පැළඳීමට නොහැකි වී තිබුණි. තවද, පිරිස් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශයන් හා අඩු මිල ලංසුකරුගේ ඉල්ලීම් නොසළකා රු.මිලියන 51.08 ක වැඩි පිරිවැයක් දරා මිලදී ගෙන තිබුණු අතර, තෝරාගත් සැපයුම්කරු ඇණවුමෙන් සියයට 30 ක් සපයා ඉතිරිය රු.මිලියන 34.21 ක් මිල වැඩිකොට සැපයීමට කළ යෝජනාවට යුද්ධ හමුදාව එකඟ වී තිබුණි. | රුපියලේ අගය අවප්‍රමාණය වීම, කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ගුවන් ගමන් සීමා වීම, වැනි තත්ත්වයන්වලට මුහුණදීමට සිදු වූ අතර, සැපයූ භාණ්ඩවල නියැදි ප්‍රසම්පාදන කමිටුව අනුමත කර ඇති බව සහ නැවත මිලගණන් කැඳවීමකදී මිලගණන් වැඩිවීමට ඇති හැකියාව සහ කාලය පිළිබඳව සලකාබලා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ බව. | පැහැර හරින ලද සැපයුම්කරුවන් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම සහ සැලසුම්කළ අරමුණ සඳහා භාවිතා කිරීමට හැකිවන පරිදි හා උසස් ගුණාත්මකභාවයක් සහිතව අවම පිරිවැයක් දරමින් රජයට උපරිම ආර්ථික වාසි සැලසෙන පරිදි කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **ii.** | රු.මිලියන 83 ක වියදමින් කඳවුරු ආරක්ෂාව සඳහා Chain Link Mesh(G-10) රෝල් 810 ක් මිලදී ගැනීමේදී අඩුමිල ඉදිරිපත් කළ සුදුසුකම් ඇති ලංසුකරුවකු ලංසු ලේඛනය මඟින් මුදල් පදනම මත පමණක් භාණ්ඩ සැපයිය හැකි බව දැනුම් දී තිබුණු අතර, මෙම ලංසුකරු ලියාපදිංචි සැපයුම්කාර ආයතනයක් බැවින්, ඔවුන් එකඟකරවා ගැනීමට සාධාරණ උත්සාහයක් නොගෙන අතිරේකව රු.මිලියන 29.73 ක් වැඩිපුරගෙවා වලංගු SLS තත්ත්ව සහතිකයක්ද නොමැති භාණ්ඩ මිලදී ගෙන තිබුණි. | රටෙහි පැවති උද්ධමනකාරී තත්වයන් තුළ මුදලට පමණක් භාණ්ඩ සැපයීමට එකඟ වීම සහ වලංගු කාලසීමාව දින 30 කට සීමා වීමෙන් ලංසුකරුගෙන් නැවත විමසීම ප්‍රායෝගික නොවන බව සහ පිළිගත් වෙළඳ නාමයක් සහිත සුප්‍රකට මාදිලියකින් භාණ්ඩ ලබාදී ඇති බව. | රජයේ ගෙවීම් කාර්ය පටිපාටිය පිළිබඳ අවබෝධයක් ඇති සැපයුම්කරුවන් සමඟ නම්‍යශීලීව කටයුතු කර උපරිම ආර්ථික වාසි සලසා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **iii.** | රු.මිලියන 71.27 ක් වැයකර මැනිං ටවුන් විවාහක නිලධාරි නිවාස සංකීර්ණය සඳහා දඟර වානේ කම්බි මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන තීරණ ලබා දීමට මාස 4 කට අධික කාලයක් ප්‍රමාද වීමෙන් මිල ගණන් වලංගු කාලය ඉක්මවීම නිසා තෝරාගත් සැපයුම්කරුවන් අදාළ යකඩ තොගය එකඟ වූ මිලට සැපයීම ප්‍රතික්ෂේප කිරීමෙන්, නැවත මිල ගණන් කැඳවා පැහැරහැරි සැපයුම්කරුවකු සහ තවත් සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් සියයට 123 ක හෙවත් රු.මිලියන 28.3 ක ඉහළ මිල ගණන් මත මිලදීගෙන තිබුණු අතර, අවස්ථා දෙකේදීම 8.9.1(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් ගත වී නොතිබුණි. තවද, එකවර මිලදී ගැනීමේදී ලබා ගැනීමට හැකිව තිබුණු වට්ටම් වාසිය පිළිබඳව අවධානය යොමු නොකර අවස්ථා තුනකදී අදාළ යකඩ තොගය මිලදී ගෙන තිබුණි. | පැවති ආර්ථික අර්බුදය හා විදේශ විනිමය අනුපාතය අනපේක්ෂිත ලෙස ඉහළ යාම නිසා අදාළ සැපයුම්කරු හට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව කටයුතු කර අදාළ සැපයුම ප්‍රදානය කිරීමට කටයුතු කර ඇති බව සහ අදාළ ව්‍යාපෘතිය, ඉටුකරනු ලබන සේවා ස්ථානය වෙතින් සේවාවේ ඇති අවශ්‍යතාවය අනුව මිලදී ගෙන ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි කටයුතු කර අවම පිරිවැයක් යටතේ උපරිම ආර්ථික වාසි සලසා ගත හැකි වන ආකාරයට ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වීම. |
| **iv.** | යුද්ධ හමුදාවේ වෛද්‍ය කටයුතු වඩාත් කාර්යක්ෂමව හා උසස් අන්දමින් පවත්වා ගැනීම සඳහාත්, දිවයින තුළ සිදුවන ස්වභාවික ව්‍යසන, වසංගත රෝග හා විශේෂ ආරක්ෂක රාජකාරීවලදී යුද්ධ හමුදා සාමාජිකයින්ට අමතරව සිවිල් ජනතාව වෙතද වෛද්‍ය සේවාවන් විධිමත්ව ඉටුකිරීම සඳහාත් රු.මිලියන 38.51 ක් වැයකර ජංගම වෛද්‍ය පරීක්ෂණ කාමරයක් හා ෆාමසියක් සහිත බස් රථයක් සහ ජංගම රසායනාගාර පහසුකම් සහිත බස් රථයක් මිලදීගෙන 2022 මැයි මාසයේ යුද්ධ හමුදා රෝහලට අනුයුක්ත කර තිබුණද, මෙම බස්රථ දෙකෙන් ප්‍රතිකාර ලැබූ රෝගීන් ප්‍රමාණය 805 ක්ද පරීක්ෂණය සඳහා යොදාගත් දින ගණන 03 ක්ද වූයෙන් සමාලෝචිත වර්ෂයේ අදාළ බස් රථවල උපයෝජනය ඉතා අඩු මට්ටමක පැවතුණි. තවද, ජාතික අයවැය දෙපාර්තමේන්තුව රු.මිලියන 12.58 කට මෙම බස්රථ මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණද, එම මූල්‍ය සීමාවන් සියයට 206 කින් ඉක්මවා තිබුණු අතර, 5.3.1(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව | ඉදිරියේදී බස් රථ දෙක වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා කටයුතු කරන අතර, වසංගත තත්වය මත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීමෙන් රුපියලේ අගය අවප්‍රමාණය වීම මත ඇස්තමේන්තු අගයන් ඉක්මවා ඇති බව සහ අදාළ මිලදීගැනීම සඳහා එකිනෙකට වෙනස් පිරිවිතර 02 ක් භාවිතා වන බැවින් ප්‍රසම්පාදනයන් දෙකක් ලෙස ක්‍රියාත්මක කර ඇති බව. | ආර්ථික අපහසුතා මධ්‍යයේ මිලදී ගත් මෙම වත්කම් මිලදී ගැනීමේ අරමුණු ලඟාකර ගැනීම සඳහා උපයෝජනය කළ යුතු වීම සහ ඇස්තමේන්තුවලට අනුගතව රජයට උපරිම ආර්ථික වාසි සැලසෙන පරිදි කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලංසු කැඳවීමෙන් මාස 06 කට පසුව තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණි. තවද, එකම කාල වකවානුවක, එකම ආයතනයකින් මිලදීගෙන තිබුණද ලබාගත හැකි මිල සහ වට්ටම් වාසි ගැන නොසලකා ප්‍රසම්පාදන දෙකක් ලෙස ක්‍රියාත්මක කර තිබුණි. | | |
| **v.** | නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලේ මහල් 15 ක ගොඩනැගිල්ල හා අඟුණුවැල්පැලැස්ස වෙඩි ද්‍රව්‍ය ගබඩාව ඉදිකිරීම සඳහා අවශ්‍ය පෙරමුසු කොන්ක්‍රිට්, විවිධ අවශ්‍යතා සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සහ හබරකඩ මධ්‍යම ඉංජිනේරු සේවා වැඩපළ සඳහා අවශ්‍ය අලුත්වැඩියා උපකරණ මිලදී ගැනීමේදී ඇණවුම් කළ එකතුව රු.මිලියන 367.59 ක ද්‍රව්‍යවලින්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.3.11, 5.4.10 සහ 8.9.1 ප්‍රකාරව ලංසු සුරක්ෂණ, කාර්යසාධන සුරක්ෂණ හා ගිවිසුම් ගත වීමක් නොමැතිව සිදුකර තිබීම නිසා, 2019, සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විවිධ අවස්ථාවල ඇණවුම් කළ රු.මිලියන 126.95 ක් වටිනා කොන්ක්‍රිට්, රු.මිලියන 5.21 ක් වටිනා අමතර කොටස් සහ රු.මිලියන 3.3 ක ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයුම්කරුවන් සපයා නොතිබුණද, ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. | නීතිමය ක්‍රියාමාර්ගයක් කොන්ත්‍රාත්කරුට එරෙහිව ගැනීමට නොහැකි බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **vi.** | රු.මිලියන 70.47 ක් වැයකර ගුවන් සංක්‍රමික බලසේනාව සඳහා Uniform Rib Stop Olive Green Kit 4500 ක් මිලදී ගැනීමේදී අදාළ නිල ඇඳුම් සියයට සියයක්ම Cotton අමුද්‍රව්‍යයෙන් නිමකරන ලද රෙදිවලින් සමන්විත විය යුතු බවට පිරිවිතර ලේඛනවලින් දක්වා තිබුණු අතර, ලංසු ලේඛන රැගෙන ගිය ලංසුකරුවන් තිදෙනෙකුගෙන් එක් අයකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු සියයට 45 ක් Polyester හා සියයට 55 Cotton වර්ගයේ රෙදිවලින් නිෂ්පාදිත නිල ඇඳුම් සැපයිය හැකි බවට මිල ගණන් සමඟ දන්වා එවා තිබුණු අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව ඒ සඳහා එකඟවී මිලදී ගැනීම සිදුකර තිබුණු අතර, මෙම තත්ත්වය මිල තරඟය සීමා කිරීමට කටයුතු කිරීමක් ලෙස නිරීක්ෂණය කෙරේ. තවද, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය වී තිබුණේ සැපයුම්කරුගේ නියැදි තාක්ෂණික පිරිවිතර හා එකඟ නොවන බව වුවත් ක්ෂේත්‍ර පරීක්ෂණයක ප්‍රතිඵල මත එම නිර්දේශය පසුව වෙනස්කර තිබුණු අතර, මෙම ඇඳුම් කට්ටලවල කැප්ද උචිත නොවන බවට ගුවන් සංක්‍රමික බල සේනාවද දැනුම්දී තිබුණි. තවද, අවස්ථා 02 කදී සපයා තිබූ රු.මිලියන 60.09 ක් වටිනා නිම් ඇඳුම් තොගවල වර්ණයන් යුද්ධ හමුදාවට මිලදී ගැනීමට එකඟවූ වර්ණයට වඩා වෙනස්ව සපයා ඇති බව තත්ත්ව ආරක්ෂණ හා පිරික්සුම් අධ්‍යක්ෂ මණ්ඩලය දන්වා තිබුණද, එම තත්ත්වයන් සලකා බලා නොතිබුණි. | 2020 වර්ෂයෙන් පසුව නිළඇඳුම් ලබාගැනීම සීමා සහිතවීම හේතුවෙන් අවශ්‍යතාවයේ ප්‍රමුඛතාවය මත ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසු නිදහස් උත්සව දින පෙළපාලිය වෙනුවෙන් මිලදී ගැනීම සිදුකර ඇති බව. | නියමිත ප්‍රමිතීන්ට, පිරිවිතරවලට සහ යහපත් පාලනයට අනුකූලව කටයුතු කළ යුතු වීම සහ සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගිවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **vii.** | රු.මිලියන 50.36 ක් වැයකර යුද්ධ හමුදා ජොෂ්ඨ නිලධාරීන් සඳහා Cap Peak Brown Chin Trap Gold and Silver Button 1600 ක් මිලදී ගැනීමේදි ඉදිරිපත් කර තිබුණු පිරිවිතර ලේඛනය අවශ්‍යපරිදි ප්‍රමාණාත්මකව විස්තර කර නොතිබුණු අතර, පසුව ලංසු ඇගයීමේදි ප්‍රධාන විෂයගත කරුණුවලට අදාළ නිශ්චිත පිරිවිතර යොදාගෙන ඇගයීම් කටයුතු සිදුකිරීම නිසා 7.7 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන වලින් බැහැරව ලංසු ඇගයීම සාධාරණත්වයෙන් තොරව සිදුකර තිබීමෙන් රු.මිලියන 13.04 ක වැඩි වැයබරක් දරමින් අදාළ නිල ඇඳුම් ආයිත්තම් ප්‍රසම්පාදනය කර ගැනීමට සිදු වී තිබුණි. | මෙම ප්‍රසම්පාදනය සිදුකරන අවස්ථාවේදී පිරිවිතරයන්හි වර්ණ කේත දක්වා නොමැති අතර, මේ වන විට එම නිරීක්ෂණ සමතයකට පත්කර පිරිවිතර යාවත්කාලීන කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම සහ යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයට ගැළපෙන තාක්ෂණික පිරිවිතරයන් සකස් කළ යුතු වීම. |
| **viii.** | රු.මිලියන 22.52 ක් වැයකර දියතලාව-17 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව විසින් අවස්ථා 21 කදී ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීමේදී 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව පණවා ඇති උපරිම මූල්‍ය සීමාව ඉක්මවා කටයුතු කර තිබුණි. | රජයේ වැට් බදු වටිනාකම එකතුවීම හේතුවෙන් රු.මිලියනය ඉක්මවා ගොස් ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **ix.** | රු.මිලියන 22.2 ක් වැයකර කොම්පඤ්ඤවීදිය විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපොළ සඳහා වාහන අමතර කොටස් සහ පනාගොඩ 1වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී 6.2.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදිය යුතු අවම කාල සීමාව ලබා දී නොතිබුණි. | ආරක්ෂක අංශයේ රථ කඩිනමින් අලුත්වැඩියා කිරීමේදි මෙම තත්ත්වය හටගෙන ඇති බව සහ ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී ප්‍රමාද දෝෂයකින් ලංසු කැඳවීමේ ආරම්භක දිනය වැරදියට සටහන් වී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **x.** | රු.මිලියන 17.14 ක් වැයකර මේජර් ජනරාල්, බ්‍රිගේඩියර් හා කර්නල් නිලයන් සඳහා නිල ඇඳුම් කට්ටල 450 ක් හා රෙදි මීටර් 25,000 ක් මිලදී ගැනීමේදී තාක්ෂණික පිරිවිතර පටු ආකාරයට විස්තර කිරීම නිසා සැපයුම්කරුවන් අවස්ථා කිහිපයකදීම ප්‍රතිචාර දක්වා නොතිබුණු අතර, පසුව යුද්ධ හමුදාව ලබාදුන් ඇතැම් පිරිවිතර වලටද එකඟ නොවූ නිල ඇඳුම් මිලදී ගෙන තිබුණි. තවද, Cloth Rib –Stop Black CR/SF Pattern රෙදි මීටර් 25,000 ක් මිලදී ගැනීමේදී තත්ත්ව පරීක්ෂණ වාර්තා සඳහා ලංසුකරුවකුගෙන් ගාස්තු අයකර සැලසුම් කළ පරීක්ෂණද සිදුකිරීමකින් තොරව සැපයුම්කරු තෝරාගෙන තිබුණි. | සියලුම නිල ලාංඡන හා රෙදිපිළි සඳහා ඉදිරියේදී වර්ණ කේත සහිතව පිරිවිතර යාවත්කාලීන කරන අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව වෙතින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර ඇති බව සහ ඒ මත ලබාගන්නා ලද කරුණු උපයෝගීකර ගනිමින් දෘෂ්‍ය පරීක්ෂාවක් සිදුකර පිරිවිතරයට වඩාත් ගැළපෙන ලෙස මිලදී ගැනීම සිදුකර ඇති බව. | ස්ථාවරව පිළියෙල කරන තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම සහ සැලසුම් කළ පරිදි තත්ත්ව පරීක්ෂණ වාර්තාවල ප්‍රතිඵල මත නිර්දේශයන් ලබා දිය යුතු වීම. |
| **xi.** | රු.මිලියන 11.25 ක් වැයකර නිලධාරීන්ට ඇඟ උණුසුම් කිරීමේ ඇඳුම් මැසීමට Tricot රෙදි මීටර් 25,000 ක් මිලදී ගැනීමේදී පෙර සැලසුම්කර තිබුණු පරිදි පර්යේෂණාගාර වාර්තාවක් ලබාගෙන නොතිබුණු අතර, නිශ්චිත පිළිගත හැකි හේතුවක් නොදන්වා අඩු මිල ඉදිරිපත් කළ ලංසුකරු ප්‍රතික්ෂේප කිරීම නිසා රු.මිලියන 6.28 ක වැඩි මිලකට ආදල රෙදි තොගය ප්‍රසම්පාදනය කර ගෙන තිබුණි. | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් පරීක්ෂණාගාර වාර්තාවක් ලබා නොගෙන ක්ෂේත්‍ර පරීක්ෂාවක් හා දෘෂ්‍ය පරීක්ෂාවක් සිදුකර මිලදී ගැනීම සඳහා අවැසි ඉදිරි කටයුතු සිදුකර ඇති බව. | සැලසුම් කළ පරිදි පර්යේෂණාගාර වාර්තා මත පදනම්ව තීරණ ගත යුතු වීම. |

**3.3 වත්කම් කළමණාකරණය** ෟග් **නිර්දේශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | සාම සාධක රාජකාරීන් සඳහා මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කළ 685 ක හට පිරිසක් සඳහා අවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ 2016 හා 2017 වර්ෂ තුළදී මිලදී ගෙන තිබුණු අතර, මෙම මිලදී ගත් ප්‍රවාහන හා අනෙකුත් උපකරණ අතරින් රු.බිලියන 1.38 ක ප්‍රවාහන හා උපකරණද, වට්නාකම් අනාවරණය නොකෙරුණු තවත් වාහන හා උපකරණ තොගද, නිශ්කාර්යව දිවයිනේ විවිධ ප්‍රදේශවල ගබඩාකර තිබුණි. | අදාළ භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ අවශ්‍යතාවය පරිදි උපයෝජනය කිරීමට කටයුතු කරනු ලබන බව. | අවශ්‍යතාවය පරිදි භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කළ යුතු අතර, මේ වන විටත් මිලදී ගෙන ඇති මෙම තොග රජයට උපරිම වාසි සැලසෙන පරිදි උපයෝජනය කළ යුතු විම. |
| (ආ) | 2007 වර්ෂයේදී පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු විසින් සම්පාදිත මු.පි.මහ 3784 දරන නීත්‍යානුකූල පිඹුර මඟින් මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටෙයාර් 14 ක ඉඩමක් කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් විසින් 2007 වර්ෂයේදී යුද්ධ හමුදාවට පවරා දී තිබුණු අතර, මෙම ඉඩම නිශ්කාර්යව පැවතීම නිසා අනවසර පදිංචිකරුවන් විසින් බලහත්කාරයෙන් පදිංචි වී සිටින බව 2016 වර්ෂයේදී මැනීම් කටයුතු සිදු කිරීමට යාමේදී යුද්ධ හමුදාව විසින් අනාවරණය කර ගෙන තිබුණද, මෙම අනවසර පදිංචිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම නිරවුල් කර ගැනීම සඳහා නීතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | යුද්ධ හමුදාවේ වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | මඩකළපුව දිස්ත්‍රික්කයේ වාර්ෂිකව රු.මිලියන 1.74 ක් වැයකර අක්කර 5.74 කට අයත් බිම් කොටස් 39 ක් නිවාස හෝ ගබඩා ඉදිකිරීම සඳහාත්, දිවයිනේ විවිධ ප්‍රදේශවලින් වාර්ෂිකව එකතුව රු.මිලියන 187.37 ක් වැයකර වර්ග අඩි 226,160 ක ගොඩනැගිලි 39 ක් නවාතැන් පහසුකම්, කාර්යාල හා ගබඩා පහසුකම් සලසා ගැනීම සඳහාත්, වර්ෂ 31 කට අධික කාලයක සිට කුලී පදනම ලබාගත් ඉඩම් හා ගොඩනැගිලි වෙනුවට රජය සතු වෙනත් ඉඩම් හෝ ගොඩනැගිලි සපයා ගැනීමට මෙතෙක් අවධානය යොමු වී නොතිබුණි. | මෙම ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිකරුවන් හඳුනාගෙන නැවත භාරදීමට කටයුතු කරන බව සහ හමුදා මූලස්ථාන ව්‍යාපෘතියෙන් යෝජිත පහසුකම් ලද පසු ගොඩනැගිලි නැවත භාරදීමට හැකියාවක් පවතින බව. | රජය සතු වත්කම්වලින් උපරිම ප්‍රයෝජනය ගෙන වියදම් සීමා කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | විධිමත්ව පවරා ගැනීමකින් තොරව යුද්ධ හමුදාව විසින් වෙනත් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුලු රජයේ තවත් ආයතනවලින් ට්‍රක් රථ 32 ක්ද, ගිලන්රථ 17 ක්ද, ට්‍රැක්ටර් 11 ක්ද, කැබ් රථ 11 ක්ද, ජීප් රථ 5 ක්ද, ට්‍රැක්ටර් ටේලර් 4ක්ද, ජල හා ඉන්ධන බවුසර් 04 ක්ද, බස්රථ 3 ක්ද, ටිපර් රථයක්ද, අණ හා මාණ්ඩලික රථයක් හා යතුරුපැදි 8 ක්ද පරිහරණය කරමින් පවතී. | රජයේ දෙපාර්තමේන්තු ඇතුලු තවත් සිවිල් ආයතන වල වාහන යුද්ධ හමුදාවට පරිත්‍යාග කර ඇති බව හා යුද්ධ හමුදා ක්‍රමවේදයට අනුව පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා යුහ අංක ලබාදී ඇති බව. | අදාළ වත්කම් විධිමත්ව පවරා ගැනීමට හෝ අදාළ ආයතන වෙත මුදා හැරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | යුද්ධ හමුදාවට අයිති වාහන 1,320 ක්ද, යුද්ධ හමුදාව පරිහරණය කරමින් පවතින වාහන 1,839 ක්ද හා යුද්ධ හමුදාවට වෙනත් ආයතනවලින් ලැබී ඇති වාහන 42 කට අදාළව සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි සහතික හා තක්සේරු වාර්තා වල ප්‍රමාදයක් නිසා රක්ෂණාවරණ ලබාගැනීමට නොහැකිවී ඇති බව. | රක්ෂණය කළ යුතු වාහන සඳහා කඩිනමින් රක්ෂණාවරණ ලබාගත යුතු වීම. |
| (ඊ) | 1998 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මිලදීගත් රු.මිලියන 4.33 ක් වටිනා වාහන සහ අනෙකුත් අමතර කොටස් වර්ග 216 ක අයිතම 1,888 ක් හා වටිනාකම් අනාවරණය නොකෙරුණු අමතර කොටස් වර්ග 37 කට අදාළව අයිතම 838 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට නොගෙන කොම්පඤ්ඤවීදිය විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපොළ ගබඩාවේ පැවතුණි. | මෙම අමතර කොටස් මූලික වැඩපොළ වෙතින් සිදුකරනු ලබන අලුත්වැඩියා කටයුතුවලට නිකුත් කිරීමට කටයුතුකර ඇති බව. | අවශ්‍යතාවය සහ නිකුත් කිරීම් නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. |
| (උ) | පනාගොඩ ඉංජිනේරු සේවා රෙජිමේන්තු ගබඩාවේ රු.මිලියන 2.09 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය 119 කට අදාළව අයිතමයන් 15,237 ක ප්‍රමාණයක් වර්ෂ 04 කට අධික කාලයක සිට නිකුත් නොකර පැවතීම නිසා ඒවායේ ආර්ථික ඵලදායීතාවය බෙහෙවින් හීන වී තිබුණු අතර, රු.මිලියන 2.56 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීම් උපකරණ අයිතම 39 ක් සම්පූර්ණ වගකීම් කාලය ඉක්මවන පරිදි නිකුත් නොකර රඳවාගෙන තිබුණි. තවද, වර්ෂයක පමණක් වගකීම් කාලයක් ඇති රු.මිලියන 13.43 ක් වටිනා උපකරණ වර්ග 21 කට අයත් අයිතම 185 ක වගකීම් කාලය මාස 08 සිට මාස 11 ක් දක්වා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව ගබඩාව තුළ නිෂ්කාර්යව තිබුණි. | මේ වන විට අදාළ ඉංජිනේරු භාණ්ඩ යම් ප්‍රමාණයක් නිකුත් කර ඇති අතර, ඉතිරි ඉංජිනේරු භාණ්ඩ ඉදිරියේදී සිදුකරනු ලබන සේවාවන් සඳහා කඩිනමින් නිකුත් කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදුකර ඇති බව. | අවශ්‍යතාවය සහ නිකුත් කිරීම් නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යුද්ධ හමුදාවේ විවිධ වත්කම්වලට සිදුවූ රු.මිලියන 13,233.66 ක අලාභ හානි 173 ක් හා රිය අනතුරු 303 කට අදාළව සිදුවූ රු.මිලියන 222.21 ක අලාභ ලෙස එකතුව රු.මිලියන 13,455.87 ක ශේෂයක් පැවතුණු අතර, මෙම අලාභ හානිවල වසර 10 කට වැඩි සිද්ධි 88 කට අදාළව රු.මිලියන 197.22 කද, වසර 05 ට වැඩි සිද්ධි 166 කට අදාළව රු.මිලියන 12,933.89 කද, පැවතුණු අතර, මෙම ශේෂ අයකර ගැනීම හෝ කපා හැරීම මන්දගාමී ස්වභාවයක පැවතුණි. | අදාළ ශේෂයන් අයකර ගැනීමට හෝ කපා හැරීමට අවැසි ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | අදාළ අලාභ හානි අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යුද්ධ හමුදාව විසින් පවත්වාගෙන ගිය ලේඛන අනුව යුද්ධ හමුදාවේ ස්ථාවර වත්කම් වර්ග 69 කට සිදු වූ රු.මිලියන 733.76 ක අලාභ හානි පොත් වලින් කපා හැර තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයට මෙම කපාහල අගයන් ඇතුළත් කර නොතිබුණි. | 2023 වර්ෂයේදී මෙය නිවැරදිකර වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව. | අදාළ කපාහළ අගයන් මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කළ යුතු වීම. |
| (ඇ) | සිද්ධීන් 252 කට අදාළව එකතුව රු.මිලියන 846.46 ක පසුගිය වර්ෂ අවසාන ශේෂයන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පොත් වලින් කපාහැරීම් ප්‍රකාශයේ ආරම්භක ශේෂ ලෙස වාර්තා කර නොතිබුණු අතර, පසුගිය වර්ෂයේ අවසාන ශේෂ ලෙස දක්වා නොතිබුණු අලාභ හානි සිද්ධීන් 106 කට අදාළව රු.මිලියන 252.18 ක ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස දක්වා තිබුණි. තවද, පසුගිය වර්ෂයේ අලාභ හානි සිද්ධි 17 කට අදාළව රු.මිලියන 29.43 ක් වැඩියෙන්ද, සිද්ධි 05 කට අදාළව රු.මිලියන 11.15 ක් අඩුවෙන්ද සමාලෝචිත වර්ෂයේ පොත් වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනැවිත් තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පසුගිය වර්ෂයේ අවසාන ශේෂයන් නිවැරදිව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස දැක්විය යුතු වීම. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශය මඟින් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා යුද්ධ හමුදාවේ වත්කම් වර්ග 52 කට සිදුවූ එකතුව රු.මිලියන 24.02 ක අලාභ හානි හෙළිදරවු කර නොතිබුණි. | මෙම අලාභ හානි 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | අදාළ අලාභ හානි මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වීම. |
| (ඉ) | 1990 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා යුද්ධ හමුදාවේ වාහන වලට සිදුවූ රිය අනතුරු 306 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අවසන් නොකළ ගොනු සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අවසන් කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 3.5 මතභේදාත්මක ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යුද්ධ හමුදාවට සැපයුම් හා සේවා ලබාදීම වෙනුවෙන් පුද්ගලික ආයතන 07 කට 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 137.15 ක මුදලක් අයවිය යුතු බවට අදාළ ආයතන විසින් විගණනයට තහවුරු කර ඇති අතර, එම වටිනාකමට අදාළ සැපයුම් හා සේවා වෙනුවෙන් එම ආයතන වලින් බිල්පත් ඉදිරිපත් නොවූ බවට යුද්ධ හමුදාව විසින් විගණනයට වාර්තා කර තිබුණි. | මෙම වටිනාකම්වලට අදාළ කිසිදු බිල්පතක් යුද්ධ හමුදාවට ඉදිරිපත්කර නොමැති බව. | මෙම පරස්පර තත්ත්වයන්ට හේතු වූ කරුණු සොයාබලා කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතු වීම. |

### 3.6 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දියතලාව, පනාගොඩ හා අනුරාධපුරය යුද්ධ හමුදා කඳවුරුවල ගබඩා සඳහා මිලදී ගත් රු.මිලියන 5.39 ක් වටිනා කවර් අවුටස් 218 ක්, වාහන බැටරි 80 ක් හා විවිධ කාර්යාල හා විදුලි උපකරණ, වගකීම් කාලය තුළ ප්‍රයෝජනයට නොගැනීම නිසා පාවිච්චියට නුසුදුසු තත්ත්වයට පත්වීමෙන් අපහරණය කිරීමට සිදුව තිබුණි. | භාවිතයට ගත හැකි තොග අයිතම නිකුත් කිරීමටත්, අනෙකුත් තොග අයිතම අයෝග්‍ය කිරීමටත් කටයුතු කරන බව. | අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. |

### 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වේරහැර යුද්ධ හමුදා රෝහල තුළ පිහිටි ඖෂධ ගබඩා ගොඩනැගිල්ල සෞඛ්‍ය අමාත්‍යාංශ සහ ඖෂධ නියාමන අධිකාරියේ හා අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව සකස්කර නොතිබුණු අතර, ඖෂධ ගබඩා කිරීම සඳහා වර්ග අඩි 14,450 ක ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2019 වර්ෂයේ සැලසුම් කර තිබුණද, එම අවශ්‍යතාවය මෙතෙක් සම්පූර්ණ කර ගෙන නොතිබුණි. | අදාළ ඉදිකිරීම සඳහා 2024 වර්ෂයේදී ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට සැලසුම් කර ඇති බව. | සැලසුම් කළ පරිදි අදාළ ගොඩනැගිල්ල ඉදිකර, ආරක්ෂිතව ඖෂධ ද්‍රව්‍ය ගබඩා කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ගත යුතු වීම. |

### 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යුද්ධ හමුදා කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 32,599 ක් හා සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක්, තෘතීක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 60 ක් ඇතුලු සමස්ත පුරප්පාඩු 34,770 ක් පැවතුණි. | රාජ්‍ය සේවයට බඳවාගැනීම් සීමාකර ඇති බැවින් ඊට අනුගතව යුද්ධ හමුදාව කටයුතු කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැළපෙන ආකාරයට අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |